චක්‍රලේඛ අංක 07/2021

මගේ අංකය- WPCEC/MA 01/චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව(බ.ප),
අංක. 628,
ජනජයසිටි ගොඩනැගිල්ල, 8 වන මහළ,
නාවල පාර,
රාජගිරිය.
2021.11. 24

බස්නාහිර පලාතේ
සියළුම වි.සේ.ස.සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්,
සමුපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල හා
අනෙකුත් සියළුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

**සම්මුඛ පරීක්ෂණ මණ්ඩල විසින් ලකුණු ලබාදීමේ ක්‍රියාපටිපාටිය**

සමුපකාර සමිති විසින් තනතුරු සඳහා බඳවා ගැනීමට පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ වලදී 07/2019 කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව මෙතෙක් අනුගමනය කරන ලද ලකුණු ලබා දීමේ ක්‍රමවේදය මෙයින් සංශෝධනය කරනු ලබන බව කොමිෂන් සභා නියමය පරිදි දන්වා සිටිමි.

- අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබාදීමේ පරිපාටිය -ඇමුණුම 01
- බාහිර අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබාදීමේ පරිපාටිය -ඇමුණුම 02
- සම්මුඛ පරීක්ෂණයේදී මූලික සුදුසුකමට අතිරේක අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබාදීම -ඇමුණුම 03
- ලකුණු ලැයිස්තුව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා -ඇමුණුම 04(අ)
- ලකුණු ලැයිස්තුව බාහිර අයදුම්කරුවන් සඳහා -ඇමුණුම 04(ආ)

02. අදාල තනතුර සඳහා බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීම කළ යුතුය. අයදුම්කරු විසින් තනතුරට අයදුම් කරනු ලබන මූලික සුදුසුකම හැර එම තනතුර සඳහා සමුපකාර සේවක කොමිෂන් සභා බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් අනෙකුත් මූලික සුදුසුකම් ද අයදුම්කරු විසින් සපුරා ඇත්නම් එම සුදුසුකම් සඳහා ලකුණු ලබාදිය යුතුය. අයදුම්කරුවන් සඳහා ලකුණු ලබාදීමේදී මේ සමඟ ඇති ඇමුණුම් - 04(අ) , 04(ආ) ආකෘතිපත්‍ර ප්‍රකාරව පමණක් ලකුණු සටහන් කර කොමිෂන් සභාව වෙත සහතික කල පිටපතක් ඉදිරිපත් කළ යුතු වේ.

03. යම් තනතුරක් සඳහා කොමිෂන් සභාවේ අනුමත මූලික සුදුසුකම් නොමැති අයවළුන් අයදුම්කර තිබෙනම්, ඔවුන් පිළිබඳ තොරතුරු ඇමුණුම -05 ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ කර සමිතිය භාරයේ තබාගත යුතුය.

04. මෙම චක්‍රලේඛ විධිවිධාන 2021.12.01 දින සිට ක්‍රියාත්මක වන අතර 07/2019 සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛය හා මාගේ අංක DO1/01/2017 දරන 2020.02.10 දිනැති ලිපිය එදින සිට අවලංගු කරනු ලබන බවද කොමිෂන් සභා නියමය පරිදි දන්වමි.

එල්.පී. මනෝජා එස් පතිරණ
ලේකම් (වැ.බ.)
සමුපකාර සේවක කොමිෂන් සභාව.
බස්නාහිර පළාත.

පිටපත්: 01. ලේකම්, පළාත් මාර්ග, ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යාංශය, බස්නාහිර පළාත - කාරුණික දැ.ගැ.පි.
02. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර්, බස්නාහිර පළාත - කාරුණික දැ.ගැ.පි.